**බණ්ඩාරවෙල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 07 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.3,428,180 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් කොට්ඨාශ 03 ක දුන් වට්ටම් රු.260,134 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් කොට්ඨාශ 03 ක අයකර වරෙන්තු ගාස්තුව රු.125,984 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.64,184 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් රු.594,306 කින් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ජංගම වත්කම් යටතේ දැක්විය යුතු රු.70,519 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟ හිටි විනෝද බදු ආදායම් රු.153,152 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ) වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කුලී පදනම මත ලබාදෙන එෆ්ජීජේ වෙළෙඳ ව්‍යාපාර වල එක්වර අයකිරීම් වටිනාකම (Key Money) බැංකු තැන්පත් කිරීම මත ලැබුණු පොලිය රු.816,976 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(එ) වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳසැල් කුලියට දීමෙන් එක්වර අයකිරීම් (වාණිජ) ලැබිය යුතු වූ රු.532,784 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඒ) 2014 වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු. 82,860 ක් වටිනා ලීටර් 20 ප්‍රමාණයේ කසළ බඳුන් 300 ක් අවසන් තොග ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොලී රු.260,385 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම් රු.213,124 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ ජල ගාස්තු ආදායම් රු.133,179 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ජල ගාස්තු රු.260,824 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ච) ඉකුත් වර්ෂයේ පොල බදු දීම යටතේ ලැබිය යුතු ආදායම් රු.1,291,751 ක් වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ තානායම් කළමනාකරණ ගාස්තු ආදායම් රු.1,633,500 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් රු.1,147,437 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ රු.59,968 ක ස්ථාවර තැන්පත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ණ) සමාලෝචිත වර්ෂයේ සීවලී මාර්ගයට සිදුවූ අලාභය වෙනුවෙන් පෞද්ගලික ඉදිකිරීම් කරුවෙකුගෙන් ලැබුණු රු.4,000,000 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් 03 කට අදාල ශේෂයන් උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී රු.685,679 ක වෙනසක් පැවතුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 98,104,798 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.75,889,806 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

(අ) එකතුව රු. 47,296,082 ක් වූ වත්කම් විෂයයන් 03 ක් සහ රු.58,815,233 ක් වූ වගකීම් විෂයයන් 02 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ බෙදා දෙන ලද රු.110,400 ක් වටිනා කසල බඳුන් 400 ක් බෙදා දුන් ප්‍රතිලාභී නාම ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත | |
| | (i) 42 වගන්තිය | අනවසර ඉදිකිරීම් 34 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |
| | (ii) 218 වගන්තිය | 2014, 2015 යන වර්ෂ වලට අදාල පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) 247 (අ)(ආ) වගන්ති | වෙළඳ ව්‍යාපාර 23 ක් විසින් 2016 වර්ෂය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් සභාවේ අවධානයද යොමුවී නොතිබුණි. |
| | (iv) 230(1) | මහා නගර සභා වරිපනම් සීමාවේ වරිපනම් 1 සිට 9 දක්වා වූ කොට්ඨාශ සඳහා 2007 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය දක්වා බදු අයකර තිබුණි. |
| (ආ) | 1980 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23"අ" වගන්ති | පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 09 කට බලපත්‍ර නිකුත් නොකර වෙළෙඳ බලපත්‍ර පමණක් නිකුත් කර තිබුණි. |
| (ඇ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | 2004 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අවස්ථා 30 කදී ගෙවන ලද සේවා නියුක්තිකයන්ගේ දායක මුදල් වෙනුවෙන් රු.61,311 ක අධිභාරයක් ගෙවා තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 | මිලියන 200 ට වඩා වැඩි වටිනාකම් අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩලය යටතේ ප්‍රදානය කළ යුතු වුවත්, රු.434,469,751 ක ඉදිකිරීම් මහා නගර සභාව විසින් කොටස් කිහිපයකට බෙදා ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. |
| (ඉ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය | 2016 වර්ෂය වෙනුවෙන් සෝගාතකාගාරය, කොම්පෝස්ට් අංගය සහ ආදාහනාගාරය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මු.රෙ. 168, 177(1), 185 | 2016 මාර්තු 27 දින ලැබුණු රු.4,000,000 ක් සඳහා ලදුපතක් නිකුත් කර නොතිබූ අතර, ගිණුම්ගත කිරීමක්ද කර නොතිබුණි. එම චෙක්පත 2017 මාර්තු දක්වා බැංකු ගත නොකිරීම නිසා අවලංගු වීමෙන් ආදායම සභාවට අහිමිවී තිබුණි. |
| | (ii) මු. රෙ. 571 | 2016 දෙසැම්බර් 31 දිනට වසර 02 ක කාලයක් ඉක්මවූ |

| | | |
|---|---|---|
| | | රු.3,618,949 ක් වටිනා තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>------------------------------------ | |
| | (i) xxiv වන පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්තිය | නිලධාරීන් 20 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතු රු.1,358,309 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) XIX වැනි පරිච්ඡේදයේ | |
| | (I) 4.1 ඡේදය හා 6.1.1 ඡේදය | දේපල ණය ලබාගත් හා අවුරුදු 05 ක වඩා වැඩි කාලයක් නිවාස භාවිතා කළ නිලධාරීන් 04 දෙනෙකුට රජයේ නිවාස ලබාදී තිබුණු අතර, නිලධාරීන් දෙදෙනෙකුට නිවාස දිගින් දිගටම ලබාදී තිබුණි. |
| | (II) 4.2 වගන්තිය | පොරොත්තු ලේඛනයේ නම සඳහන්ව තිබූ අනුපිළිවෙල හා අනෙකුත් සාධක පදනම් කරගෙන නිවාස බෙදා හැරීම සිදුකර නොතිබුණි. |
| (ඌ) | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජුලි 10 දිනැති PFD/ASD/02/Veh – circular – 2015 | ආයතනය සතු අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන වාහන 09 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (එ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු රථවාහන 27 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඒ) | අංක 4/2010 හා 2010 මැයි 25 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | වර්ෂය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 07 දෙනෙකු වෙනුවෙන් හා තාවකාලික පදනම මත සේවය කරනු ලබන සේවකයින් 11 දෙනෙකු වෙනුවෙන් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවා තිබුණද, අර්ථසාධක අරමුදල් අංකයක් හා බී කාඩ් පතක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අතුරු ව්‍යවස්ථාව | 2016 වර්ෂයේ ලියාපදිංචි වාහන වලින් වාහන 198 කට ගාල්කිරීමේ අවසර පත්‍ර ලබා නොදීම හේතුවෙන් රු.594,000 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි. |
| (ඕ) | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2015 ජුලි 06 දිනැති අංක **SEC/2015/05** චක්‍රලේඛය | නිලධාරීන් 04 දෙනෙකුගෙන් උපයනවිට ගෙවීම් බදු රු.19,080 ක් අඩුවෙන් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර තිබුණි. |

### 1.3.6 හඳුනා නොගත් ගනුදෙනු
----------------------------

සමාලෝචිත වර්ෂයේ ලෙජර් ගිණුම් පරීක්ෂාවේ දී රු.550,964 ක් වටිනා ගනුදෙනු ශේෂයන් තහවුරු කර ගැනීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,383,629 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 43,001,739 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

--------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.54,367,288 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායමෙන් සියයට 27 ක් එනම් රු.10,892,776 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් හිඟ හිටිව පැවතුණි.

2.2.2 **බදු කුලී**

---------

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ කඩ කුලිය රු.4,684,192 ක් වූ අතර, කඩ කාමර 174 කට අදාලව මාස 06 සිට මාස 75 දක්වා කාල පරාසයයක් සඳහා හිඟ කඩ කුලිය රු.3,926,648 ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 නොවැම්බර් 10 දින වන විට බණ්ඩාරවෙල මහා නගර සභාව සතුව තිබූ කඩ කාමර 239 ක් ගිවිසුම්වලට එළඹීමකින් තොරව හා ගිවිසුම් කාලය අවසන් වීමෙන් අනතුරුව නැවත ගිවිසුම් අළුත්කිරීමකින් තොරව ව්‍යාපාර කටයුතු කරගෙන යාම වෙනුවෙන් බාහිර පාර්ශවයන්ට ලබාදී තිබුණි. 2012 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන මාසික කුලිය අයකරමින් තිබූ අතර, එම කුලිය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බණ්ඩාරවෙල මහා නගර සභාවට අයිති කෝපියාවත්ත ඉඩම බදු ලබාගත් පුද්ගලයන් 18 දෙනෙකුගෙන් 2016 වර්ෂය වෙනුවෙන් රු.93,383,468 ක හිඟ බදු කුලියක් අයකරගෙන නොතිබුණි.

2.2.3 **ජල ගාස්තු ආදායම්**

----------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වන විට ජල පාරිභෝගිකයින් ගෙන් අයවිය යුතු හිඟ ජල ගාස්තුව රු.5,043,412 ක් විය. ඉන් රු.2,230,499 ක් පසුගිය වර්ෂය හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිඟ ජල ගාස්තු වූ නමුත්, එම ගාස්තු අයකිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ජලය තොග වශයෙන් මිලදී ගෙන ජල පාරිභෝගිකයින්ට ලබාදීමේදී රු.225,858 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) ජල පාරිභෝගිකයින් 1646 වෙනුවෙන් ජල මනු සවි කර නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,492,248 ක් අයකර ගෙන නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) මහා නගර සභා ආඥා පනතේ 185(ඌ) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන නිලධාරියෙකු වෙනුවෙන් සභා අරමුදලින් ගෙවන ලද දේපල ණය පොලී රු.32,579 ක් පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645(ආ) ප්‍රකාරව වාහන භාවිතා කරන නිලධාරියාගේ සහතික වීමකින් හා විධිමත් අනුමැතියකින් තොරව ZA – 4922 බැකෝ රථයට රු.18,155 ක් වටිනා ඉන්ධන ලීටර් 191.10 ක් වැයකරමින් ඉදිකිරීම් කාර්යයන් සඳහා යොදවා තිබූ අතර, එම ඉදිකිරීම් මහා නගර සභාවේ කොන්ත්‍රාත් 09 සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කර විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ සභාව සතු රථවාහන 06 ක මයිලෝ මීටරය ක්‍රියාවිරහිතව පැවති අතර, ධාවනය කරන ලද දුර ආසන්න වශයෙන් දක්වමින් 2016 වර්ෂය තුළ රු.954,750 ක් වටිනා ඉන්ධන ලීටර් 10,050 ක් භාවිතා කර තිබුණි.

3.2 **නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

මහා නගර සභාවට අයත් කැබ් රථයක්, මෝටර් ලොරියක් සහ අත් ට්‍රැක්ටරයක් අක්‍රියව පැවති අතර අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 **හඳුනාගත් අලාභ**

(අ) මහා නගර සභාවක් වීමට පෙර බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අයත්ව තිබූ කඩ කාමර 02 ක හිඟ කුලී අයකර ගැනීම වෙනුවෙන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව පුද්ගලයින් දෙදෙනෙකුට නඩු පවරා තිබුණි. 2012 නොවැම්බර් 08 දින හිඟ කඩ කුලිය වශයෙන් රු.398,970 ක් බණ්ඩාරවෙල මහා නගර සභාව වෙත ගෙවීමට විත්තිකරුවන් එකඟවී තිබූ නමුත් මෙම එකඟතාවය නොසලකා හැර අදාල විත්තිකරුවන්ගෙන් රු.210,940 ක් (බදු හැර) අයකර ගැනීම හේතුවෙන් සභාවට සිදුවී තිබූ අලාභය රු.188,030 ක් වී තිබුණි.

(ආ) රු.29,750 ක් වටිනා කිලෝ ග්‍රෑම් 25 කොම්පෝස්ට් පොහොර මළු 119 ක් හා රු.58,850 ක් වටිනා කිලෝ ග්‍රෑම් 5 බෑග් 1177 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

3.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) බණ්ඩාරවෙල මහා නගර සභාව 2013 වර්ෂයේ තොග පොල, වැව සහ නගරයේ අනෙකුත් ඉදිකිරීම් කටයුතු සඳහා නවලෝක සමාගම සමඟ රු.88,634,140 ක් හා විජේවර්ධන සමාගම සමඟ කොන්ත්‍රාත් තුනක් සඳහා රු.131,317,317 ක් හා ලක්ෂය සමාගම සමඟ රු.10,033,686 ක් හා ඇග්‍රෝ කෙමිකල්ස් සමාගම සමඟ රු.33,456,186 ක වටිනාකමට Block 1, 2, 3, 4, 5, 6, 7 කොටස් ඉදිකිරීම සඳහා ගිවිසුම්ගතවී තිබුණි.

(i) 2014 සිට වර්ෂයක් ඇතුලත නිමකළ යුතු වුවත්, මේ දක්වා මෙම ව්‍යාපෘති ඉදිකිරීම නිමකර නොතිබුණි.

(ii) අත්තිකාරම් ලෙස නවලෝක සමාගමට රු.17,726,828 ක් හා ලක්ජය සමාගමට රු.4,106,483 ක් ලබාදී තිබුණි.

(iii) තොග පොල කඩ කාමර ලබාදීම සඳහා කඩහිමියන් තෝරාගැනීම විධිමත් ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

(iv) 2014 වර්ෂයේ නව ඉදිකිරීම් වෙළඳසැල් ලබාගන්නා ව්‍යාපාරිකයන්ගෙන් රු.317,700,000 ක් අයකර ගතයුතු වුවත්, එම මුදලින් රු.242,415,231 ක් එනම්, සියයට 76 ක් මෙතෙක් අයකරගෙන නොතිබුණි.

(ආ) සීවලි පාර සාප්පු සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.30,815,862 ක් වටිනා කොන්ත්‍රාත්තුව 2015 අප්‍රේල් 2 දින නුවන් කන්ස්ට්‍රක්ෂන් වෙත ලබාදී තිබුණි.

(i) මෙතෙක් මෙම සාප්පු සංකීර්ණය ඉදිකර නොතිබුණි.

(ii) ටෙන්ඩර් දැන්වීම් අනුව ව්‍යාපාරිකයින් 25 දෙනෙකුගෙන් ඉදිකරන නව වෙළඳසැල් ලබාදීම සඳහා රු.46,175,093 ක් අයකරගත යුතු වුවත් අයකර ගැනීමට ඇති හිඟ මුදල රු.25,991,140 ක් වූ අතර, ලැබිය යුතු මුදලින් එය සියයට 56 ක් විය.

(iii) යෝජිත සාප්පු සංකීර්ණය මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ග රක්ෂිතයට ඇතුලත් ඉඩම් කොටසක ඉදිකිරීම් සැලසුම් කර තිබුණි.

(iv) 2016 මෙම ස්ථානය නායයෑම් සිදුවීම හේතුවෙන් නැවත ඇස්තමේන්තු කිරීම සඳහා රු.1,312,000 ක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ගෙවා තිබුණි.

(v) මෙම සාප්පු සංකීර්ණය ඉදිකිරීම සඳහා අඩි 40 උස වෙල්ල කැපීමේ දී මහා නගර සභාව සතු නිල නිවාසයක් හා සීවලී මාර්ගය සම්පූර්ණයෙන් විනාශවී තිබුණු අතර එම අලාභය වගකිවයුතු අයගෙන් අයකර ගෙන නොතිබුණි.

3.5 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

(අ) කොම්පෝස්ට් අංගනය තුළ සේවකයින් 12 ක් සේවයේ නියුතු අතර, ඔවුන් වෙනුවෙන් විෂබීජ නාශක හා මාසිකව වෛද්‍ය පරීක්ෂණ හා ප්‍රතිකාර ලබාදීමට කටයුතු කර නොතිබුණි. සේවකයින් බහුතරයක්ගේ ශරීරයේ තුවාල හා සමේ රෝග වැළැදී තිබීම නිරීක්ෂණය වී තිබුණි.

(ආ) කොම්පෝස්ට් අංගනය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදා ගත නොහැකි කැලි කසළ විශාල වශයෙන් රැස්ව පැවති අතර, නොදිරන පොලිතින් විශාල ප්‍රමාණයක් කැලි කසළ රැස්කරනු ලබන ස්ථානයේ තිබුණු අතර, කැලි කසළ කන්ද ආවරණය කර ඉදිකර තිබුණු බැම්ම පුපුරා කසළ කන්ද නාය යාමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) කැලි කසළ රැස්වීම හේතුවෙන් පරිසරය පුරා විශාල දුර්ගන්ධයක් පැවතීම මැස්සන්ගේ හා සුනඛයන්ගේ ග්‍රහනයට ලක්වීම හා කොම්පෝස්ට් අංගනය තුළ ජලය තිබීම නිසා අවට පරිසරය අපවිත්‍රවීම සිදුවී තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රවර්තන වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

2016 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

ප්‍රවර්තන වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු තුනක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැතියෝ සහ ණයහිමියෝ
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) ආදායම්
(ඉ) තොග පාලනය